# <u>ආනයන පාලන බලපත්‍ර යටතේ පාවිච්චි කළ වාහනයක් ආනයනය කිරීම.</u>

**ආනයන පාලන බලපත්‍ර යටතේ පාවිච්චි කළ පහත සඳහන් වාහන සඳහා ආනයන පාලන බලපත්‍ර නිකුත්කිරීමේදී පහත දක්වා ඇති කොන්දේසි හා ලේඛණ අදාල වන බව කාරුණිකව දැනුම් දෙනු ලැබේ.**

**<u>1.පොදු උපදෙස්</u>**

I. ආනයනය කරනු ලබන වාහනය දකුණෙන් පදවන වාහනයක් විය යුතුයි.

II. වාහනය වරායෙන් මුදාගත් දිනයේ සිට සති දෙකක් ඇතුලත බලපත්‍ර හිමියා නමින්ම ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි කළ යුතු අතර එය එදින සිට වසර 2 ක් යනතුරු විකිණීම ,පැවරීම හෝ අන්සතු කිරීම නොකළ යුතුයි.

III. ආනයනය කරනු ලබන රටේ පිළිගත් ආයතනයකින් නිකුත් කරන ලද තක්සේරු වාර්තාවක් ඉදිරිපත් කළ යුතුයි

IV. ආනයන අපනයන පාලක ජනරාල් විසින් බලපත්‍රය අනුමත කළ පසු 1953/28 අංක දරන 2016.02.11 දිනැති ගැසට් පත්‍රය අනුව ඉල්ලුම්කරු විසින් වාහනයේ මි.ර.ගැ (CIF) වටිනාකම හෝ වයස අනුව බලපත්‍ර ගාස්තුව දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතුයි.

V. සියලුම ආනයන, රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් කලින් කලට පනවනු ලබන තීරුගාස්තු හා වෙනත් බදු වලට යටත්වේ.

VI. බලපත්‍රය නිකුත් කරනු ලබන වාහනයම ආනයනය කළ යුතුය.

VII. ඉල්ලුම් පත්‍රය ආනයනකරු විසින්ම අත්සන් කළ යුතු අතර, හවුල් ව්‍යාපාරයක් හෝ සමාගමක් වන කල්හි අනෙකුත් සාමාජිකයන්ගෙන් බලය පැවරුනු ලියවිල්ලක් මගින් දෙපාර්තමේන්තුව සමඟ කටයුතු කිරීම සඳහා ව්‍යාපාරයේ මූලික තොරතුරු ඇතුලත් ලිපි ශීර්ෂයක් සහිත ලිපියක් මගින් එක් සාමාජිකයෙකු නම් කළ යුතුය.වාහනය හරකිරීම දක්වා කාලය තුළ ලිපි ශීර්ෂයේ යම්කිසි වෙනසක් සිදුවුවහොත් ඒ බව වහාම මෙම දෙපාර්තමේන්තුව දැනුවත් කළ යුතුය.

VIII. පෞරාණික වාහන (Vintage Vehicle) හැර අනෙකුත් සියලුම වාහන ශ්‍රී ලංකාවේ පිළිගත් වායු විමෝචන ප්‍රමිතීන් හා ආරක්ෂක ප්‍රමිතීන් වලට අනුකූල විය යුතුය.

IX. වාහන මඩ සහ පස්වලින් තොරවන බවට දෙපාර්තමේන්තුව පිළිගත් ආයතනයකින් ලබා ගත් සහතිකය ඉදිරිපත් කළ යුතුයි. (මුල්පිටපත් පමණි).

X. ශ්‍රී ලාංකිකයන් විදේශයන්හිදී උපයන ලද විනිමය උපයෝගී කරගෙන මිලදී ගනු ලැබූ මෝටර් වාහන හා රාජ්‍ය ආයතන සඳහා කෙරෙන පරිත්‍යාග හැර අනෙකුත් වාහන සඳහා විදේශ විනිමයෙන් නිදහස් ( No foreign Exchange) ක්‍රමය යටතේ වාහන ගෙන්වීමට අවසර දෙනු නොලැබේ.

XI. අනෙකුත් සියලුම වාහන සඳහා ණයවර ලිපි ( Letter of Credit ) විවෘත කළ යුතු වේ.

XII. ඉදිරිපත් කරනු ලබන සියලුම ලිපිවල පරිවර්තනයන් වේ නම් පිළිගත් භාෂා පරිවර්තකයෙකු මගින් නිල මුද්‍රාව තබා සනාථ කළ යුතුය.

XIII. අයදුම්පත්‍රය අයදුම්කරු විසින් පුද්ගලිකවම ඉදිරිපත් කළ යුතු වේ.

XIV. සියලුම ඉල්ලුම්පත්‍ර දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවිය වන www.imexport.gov.lk මගින් බාගත ( Download ) කරගත හැකිවේ.

**2.**වාහනයක් ආනයනය කිරීමට ඉල්ලුම් කිරීමේ දී පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය. (පොදු)

I. නිවැරදිව සම්පූර්ණ කරන ලද IECD-IIඉල්ලුම්පත්‍රය.
II. විදේශ සැපයුම්කරු ලබාදෙන නාමික ඉන්වොයිසිය (Performa Invoice)
III. වාහනයේ ලියාපදිංචිය අවලංගු කළ සහතිකය / ලියාපදිංචි සහතිකය.
IV. වාහනයේ ඉදිරිපස හා පසුපස දැක්වෙන පැහැදිලි ඡායාරූප.
V. ඉල්ලුම්කරුගේ අනන්‍යතාව සහතික කෙරන ලියවිලි .
VI. ව්‍යාපාර නාම/ සන්නාම ලියාපදිංචි සහතිකය හා සමාගම් අධ්‍යක්‍ෂ මණ්ඩලය සඳහන් කළ ආකෘති අංක 20 පිටපතක්. (Article of Association)
VII. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචි සහතිකය. (ආනයනය කරනු ලබන වාහනයට අනුව වෙනස් විය හැකිය.)
VIII. ව්‍යාපාරයේ නිලමුද්‍රාව හා ආදර්ශ අත්සන තබන ලද ලිපි ශීර්ෂයක්. (ලිපි ශීර්ෂයේ ව්‍යාපාර ලිපිනය, දුරකථන අංක, ඊමේල් ලිපිනය ඇතුළත් විය යුතු අතර අයදුම් පත භාර දීමෙන් පසුව යම් කිසි වෙනසක් සිදුවේ නම් වහාම ඒ බව දැනුවත් කළ යුතුය. )
IX. කලින් කළට ආනයන අපනයන පාලක ජනරාල් විසින් ප්‍රසිද්ධ කරනු ලබන හෝ අවස්ථානුකූලව නියම කරනු ලබන වෙනත් ලේඛන අදාල විය හැකිය.

**<u>3.1. කෘෂිකාර්මික කටයුතු සඳහා භාවිතා වන ට්‍රැක්ටර්</u>**

3.1.1. කෘෂිකාර්මික කටයුතු සඳහා යොදා ගන්නා ට්‍රැක්ටර් ආනයනය කිරීම සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අය වෙත ආනයන බලපත්‍ර නිකුත් කිරීම සලකා බලනු ලැබේ. ආනයනය කරනු ලබන ට්‍රැක්ටර් වර්ගීකරණය අනුව දක්වා ඇති වයස්කාණ්ඩ වලට අනුකූල විය යුතු අතර වාහනය නිෂ්පාදන දින සිට වයස ගණනය කරනු ඇත.

I. ආනයනකරු කෘෂිකාර්මික සංවර්ධන කටයුතු වල නිරත වන්නකු බවට ප්‍රාදේශිය කෘෂිකර්ම උපදේශක / කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර විසින් නිකුත් කළ සහතිකය මඟින් සනාථ කළ යුතුය.
II. වාහනය බලපත්‍රලාභියා නමින්ම ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ යුතු අතර, එදින සිට වසර 03 (තුනක් ) යනතුරු විකිණීම, පැවරීම, වෙනත් අයුරකින් අන්සතු කිරීම නොකල යුතුය.

වාහන ස්වභාවය මත රේගු සංකේතාංක වර්ගීකරණයට (Harmonized Code) අනුව වයස -

| | |
|---|---|
| 8701.20.20<br>8701.30.20 | අවුරුදු 05 සිට උපරිම සීමාව අවුරුදු 10දක්වා |
| 8701.10.10, 8701.91.20, 8701.91.40<br>8701.92.20, 8701.92.40, 8701.93.20<br>8701.93.40, 8701.94.20, 8701.94.40<br>8701.95.20, 8701.95.40 | අවුරුදු10 සිට උපරිම සීමාව අවුරුදු 15 දක්වා |

## 3.2. මෝටර් රථ වාහන

**3.2.1.මෙරටට සේවයට පැමිණෙන විදේශ දූත මණ්ඩල සාමාජිකයන් සඳහා ඔවුන් පාවිච්චි කරන ලද මෝටර් රථ මෙරට රාජකාරි කරන කාලය තුළ භාවිතය සඳහා ගෙන ඒමට අවසර ලබා දෙන අතර ඒ සඳහා පහත සඳහන් කොන්දේසි අදාළ වේ.**

I. ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිර්දේශය.
II. ආනයනය කරනු ලබන වාහනය, නිෂ්පාදිත දිනයේ සිට වසර 10ක් නොඉක්මවූ වාහනයක් විය යුතුය.
III. ශ්‍රී ලංකාවේ සේවය කරනු ලබන කාලය තුළ වාහනය විකිණීමට හෝ පැවරීමට නොහැකිය.
IV. තම රාජකාරි කාලය ඉක්ම වූ පසු වාහනය ප්‍රති අපනයනය කළ යුතු අතර විකිණීමට, බදු දීමට, උකස් කිරීමට, තෑගි කිරීමට හෝ අපහරණය කිරීමට අදහස්කරන්නේ නම් ආනයනය කළ අවස්ථාවේ තිබූ ආනයන බදු රජයට ගෙවිය යුතුය.
V. වාහනය ශ්‍රී ලංකාවේ පිළිගත් වායු විමෝචන ප්‍රමිතීන් හා ආරක්ෂක ප්‍රමිතීන් වලට අනුකූලබවට ඒ සඳහා ලියාපදිංචි ආයතන මඟින් සහතික කළ යුතුය.
VI. ආනයනය කරනු ලබන රටේ පිළිගත් ආයතනයකින් ඉදිරිපත් කරන මඩ හා පස්වලින් තොර වන බවට සහතිකය ඉදිරිපත් කළ යුතුය.
VII. වායු සමීකරණ සඳහා CFC වායුව භාවිත නොවන බවට සහතික කළ යුතුය.

**3.2.2.ශ්‍රී ලාංකිකයන් විදේශයන්හිදී උපයන ලද විනිමය උපයෝගී කරගෙන මිලදී ගනු ලැබූ මෝටර් කාර් ( Motor Car Under the Foreign Exchange Earned Aboard).**

- විදේශ රැකියාවල නියුතුව සිට උපයන ලද විදේශ විනිමය උපයෝගී කරගෙන මිලදී ගනු ලබන නිෂ්පාදිත දින සිට වසර 3 සිට 7 දක්වා පැරණි වයස් සීමාවන් තුළ මෝටර් කාර් රථය/ජීප් රථය ශ්‍රී ලංකාවට ආනයනය කිරීමට පහත කොන්දේසි යටතේ බලපත්‍ර නිකුත් කිරීමට සලකා බලනු ලැබේ.

I. විදේශ රැකියාව අවසන් කර මෙරටට පැමිණෙන විදේශ රැකියා නියුක්තිකයන් සඳහා පමණක් මෙම ක්‍රමය යටතේ බලපත්‍ර නිකුත් කෙරේ.
II. විදේශ රැකියාවෙන් උපයා ගත් මුදල් අවම වශයෙන් ඇමෙරිකන් ඩොලර් 50.000 ක් වරින් වර ශ්‍රී ලංකාවට එවූ බවට සනාථ කල යුතු වේ.
III. මෝටර් වාහනය ආනයනය කරනු ලබන රටේදී බලපත්‍ර හිමියා නමින් ලියාපදිංචි කර වසරකට නොඅඩු කාලයක් පාවිච්චිකර ඇතිබව සනාථ කළ යුතුය.
IV. බලපත්‍රය හර කරනු ලබන අවස්ථාවේ ඒ බව සනාථ නොකළහොත් වාහනය ආනයනය කර තිබුණද ආනයන බලපත්‍රය අවලංගු කරනු ලැබේ.
V. වාහනය නැව්ගත කරන දිනය වන විට එහි වයස නිෂ්පාදිත දිනයේ සිට වසර 07 ( හත) නොඉක්මවා තිබිය යුතු ය.
VI. වාහනය බලපත්‍රලාභියා නමින්ම ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ යුතු අතර, එදින සිට වසර 03 ( තුනක් ) යනතුරු විකිණීම, පැවරීම, වෙනත් අයුරකින් අන්සතු කිරීම නොකල යුතුය.
VII. ආනයන බලපත්‍රයක් ඉල්ලුම් කරන අවස්ථාවේදී අයදුම්කරු විදේශ ගතව සිටින්නේ නම් ඉල්ලුම්පත්‍රය භාරදී ආනයන බලපත්‍රය භාර ගැනීමට බලය පවරන තැනැත්තාගේ නම, ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් බලය පැවරීමේ ලිපිය, වාහනය ආනයනය කරනු ලබන රටේ පිහිටි ශ්‍රී ලංකාවේ දූත මණ්ඩල කාර්යාලය මඟින් ඉදිරිපත් කළ යුතුය.

VIII. එසේ වුවද බලපත්‍රය හර කරන අවස්ථාවේදී ගමන් බලපත්‍රය හා වාහන ලියාපදිංචි කිරීමේ සහතිකයේ මුල් පිටපතද සමඟ බලපත්‍ර හිමියා පුද්ගලිකව මෙම දෙපාර්තමේන්තුව වෙත පැමිණිය යුතුය. ( වාහනයේ ලියාපදිංචිය අවලංගු කිරීමේ සහතිකයේ මුල් පිටපත හෝ වාහනයේ අපනයන සහතිකය සහ අනෙකුත් ලියවිලි වෙනත් භාෂාවකින් ඇති විට ඒවායේ සහතික කළ ඉංග්‍රීසි පරිවර්තන සමඟ ඉදිරිපත් කළ යුතුයි ).

- **විදේශයකදී උපයන ලද විනිමය උපයෝගී කරගෙන මිලදී ගනු ලබන මෝටර් බයිසිකල් සඳහාද උක්ත කොන්දේසි අදාල වන අතර එම මෝටර් බයිසිකල්වල එන්ජින් ධාරිතාව 350 ට අඩුවිය යුතුයි.**

**3.2.3. පහත සඳහන් ලේඛනද ඉදිරිපත් කළ යුතුය.**

I. විදේශ රැකියාව මගින් උපයා ගත් ආදායම් පිළිබඳව හා වරින් වර ශ්‍රී ලංකාවට මුදල් එවූ බවට සනාථ කරන , වැටුප් විස්තර හා බැංකු ප්‍රකාශ ආදිය මගින් සනාථ කල යුතු වේ.
II. රැකියා වීසා සහතිකයේ සහතික කළ පිටපතක්.
III. මෝටර් රථය ආනයනය කරනු ලබන රටේදී තමන්ගේ නමින් ලියාපදිංචි කර වසරකට නොඅඩු කාලයක් එම රටේදී පාවිච්චි කරන ලද බවට සාක්ෂි (වාහනය ලියාපදිංචි කිරීමේ සහතිකයේ සහතික කල පිටපතක් හා වෙනත් භාෂාවකින් නිකුත් කල විටෙක සහතික කල ඉංග්‍රීසි පිටපතක්).
IV. අයදුම්කරුගේ නම ගමන්බලපත්‍රය අවලංගුවන දිනය, දිවයිනෙන් බැහැර ගිය දිනය හා ආපසු දිවයිනට පැමිණි දිනය ඇතුලත් ගමන් බලපත්‍රයේ අදාල පිටුවල සහතික කළ ඡායා පිටපත්.
V. ඉල්ලුම්පත්‍රයේ සඳහන් කරුණු සහ ඊට අමුණා ඉදිරිපත් කරන ලියවිලි නිවැරදි හා සත්‍ය බවට සහතික කෙරෙන දිවුරුම් ප්‍රකාශයක් (එය විදේශයකදී කරන්නේ නම් අදාල රටෙහි ශ්‍රී ලංකා දූත මණ්ඩල නිළධාරියෙකු ඉදිරිපිටදී අත්සන් කල යුතු අතර ඒ සඳහා මුද්දර අවශ්‍ය නොවේ)
VI. බලපත්‍රය ඉල්ලුම් කිරීමට බලය පැවරූ ලිපිය ( අදාල අවස්ථාවන්හිදි) හා අත්සන් තබා සහතික කරන ලද ලිපි.

- **මෙම ක්‍රමය යටතේ බලපත්‍ර නිකුත් කරනු ලබන්නේ එක් පුද්ගලයෙකුට ජීවිත කාලයට එකක් (one person for a life time)පමණි.**

**<u>3.3. 1956 නොවැම්බර් 30 වන දිනට පෙර නිෂ්පාදනය කරන ලද පෞරාණික වාහන (vintage vehicles).</u>**

**3.3.1 මෙහි සඳහන් පෞරාණික මෝටර්රථ යනු 1956 නොවැම්බර් මස 30 ට පෙර නිෂ්පාදනය කරන ලද මෝටර් වාහන වන අතර පහත දැක්වෙන සුදුසුකම් සපුරා ඇති පෞරාණික මෝටර් රථ සමාජ හා ඒවායේ සාමාජිකයන් වෙත පෞරාණික මෝටර් වාහන ආනයනය කිරීම සඳහා ආනයන බලපත්‍ර නිකුත් කිරීම සලකා බලනු ලැබේ.**

I. පෞරාණික මෝටර් රථ විධිමත්ව ලියාපදිංචි වූවක් විය යුතුය.
II. ඉල්ලුම්කරු පැරණි මෝටර් රථ සමාජයක සාමාජිකයෙක් නම් එකී සමාජයේ සාමාජිකත්වය ලබා අවම වශයෙන් වසර දෙකක කාලයක් ගතවී තිබිය යුතුයි. තවද, ඉපයූ විදේශ විනිමය යටතේ නිකුත් කළ බලපත්‍රයන් මත ඉකුත් වසර 05 ක කාලය තුළ මෝටර් රථයක් ආනයනය කරනු ලැබූවකු නොවිය යුතුයි.
III. මෝටර් වාහනය මගී ප්‍රවාහනය සඳහා යොදා නොගත යුතු අතර ප්‍රදර්ශන කාර්යය සඳහා පමණක්ම යොදා ගත යුතුයි.
IV. වාහනය බලපත්‍රලාභියා නමින්ම ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ යුතු අතර, එදින සිට වසර 05 (පහක් ) යනතුරු විකිණීම, පැවරීම, වෙනත් අයුරකින් අන්සතු කිරීම නොකල යුතුය.

**3.3.2.පහත සඳහන් ලේඛනද ඉදිරිපත් කළ යුතුයි.**

I. මෝටර් වාහනය 1956 නොවැම්බර් 30 ට පෙර නිෂ්පාදනය කළ බව සනාථ කිරීමට වාහනය ලියාපදිංචි කිරීමේ සහතිකය.
II. අනුමත පැරණි මෝටර් රථ සමාජයක සාමාජිකයෙකු වන කල්හි ඒ බව තහවුරු කිරීම සඳහා සාමාජික කාඩ්පත හෝ අදාල සමාජයෙන් නිකුත් කරනු ලබූ ලිපියක්.

**3.4.අවමංගල්‍ය රථ.**

3.4.1 අවමංගල්‍ය සේවාවන් සඳහා යොදා ගන්නා රථ ආනයනය කිරීම සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අය වෙත දක්වා ඇති කොන්දේසි යටතේ ආනයන බලපත්‍ර නිකුත් කිරීම සලකා බලනු ලැබේ. ආනයනය කරනු ලබන අවමංගල්‍ය රථ වර්ගී කරණය අනුව වසර 03 (තුනක්) ඉක්මවූ සහ උපරිමය අවුරුදු 10 ක් නො ඉක්මවූ වයස් කාණ්ඩයට අනුකූල විය යුතු අතර නිෂ්පාදන දිනයෙන් පසු පළමු ලියාපදිංචි දින සිට වයස ගණනය කරනු ඇත.

I. අවමංගල්‍ය සේවාවන් යටතේ ලියාපදිංචි කොට අවම වශයෙන් මාස 06 ක් සම්පූර්ණ වූ ආයතනයක් විය යුතුයි.
II. අවමංගල්‍ය රථය ආනයනය කිරීමෙන් පසුව වෙනත් වාහනයක් ලෙස පරිවර්තනය (convert) නොකරන බවට දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය.
III. ව්‍යාපාරික ස්ථානයේ ලිපිනය, දුරකථන අංක යනාදිය ඇතුලත්ව ක්‍රියාකාරී ව්‍යාපාරයක් බවට ග්‍රාම නිලධාරී, ප්‍රාදේශීය ලේකම් මඟින් සනාථ කළ යුතුය.
IV. වාහනය බලපත්‍රලාභියා නමින්ම ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ යුතු අතර, එදින සිට වසර 03 (තුනක් ) යනතුරු විකිණීම, පැවරීම, වෙනත් අයුරකින් අන්සතු කිරීම නොකල යුතුය.

**3.5.ගිලන් රථ (Ambulances).**

3.5.1 වාහනය නිෂ්පාදිත දින සිට වසර තුනක් (03) ඉක්මවූ හා වසර දහයක් (10) නොඉක්මවූ ගිලන්රථ සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති ආයතන සඳහා ආනයන පාලන බලපත්‍ර නිකුත් කිරීම සඳහා සලකා බලනු ලැබේ.

I. සෞඛ්‍ය සේවයට අදාළව සේවා සපයන රාජ්‍ය ආයතනයක් හෝ වසර 01 කට වඩා රජයේ ලියාපදිංචියක් ඇති සෞඛ්‍ය සේවා හා සම්බන්ධ පුද්ගලික ආයතනයක් වීම.
II. ගිලන් රථයක සේවයට අදාළ කාර්ය මණ්ඩලයක් සිටීම (රියදුරු හැර).
III. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ/ අදාල පළාත් සෞඛ්‍ය ලේකම්ගේ නිර්දේශය ඉදිරිපත් කළ යුතුය.
IV. එක් ආයතනයකට වසරකට එක් ගිලන් රථයක් සඳහා පමණක් බලපත්‍රයක් නිකුත් කෙරේ.
V. ගිලන් රථය වෙනත් කාර්යයන් සඳහා භාවිතා නොකරන බවට දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය.
VI. වාහනය බලපත්‍රලාභියා නමින්ම ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ යුතු අතර, එදින සිට වසර 05(පහක් ) යනතුරු විකිණීම, පැවරීම, වෙනත් අයුරකින් අන්සතු කිරීම නොකල යුතුය.

VII. පරිත්‍යාග (Donation) සඳහා පමණක් ආනයන බලපත්‍ර නිකුත් කරනු ලබන අතර ප්‍රදානය කරනු ලබන පුද්ගලයා හෝ ආයතනයේ ලිඛිත ප්‍රකාශයක් අදාළ රටේ ශ්‍රී ලංකා තානාපති කායයීාලයෙන් සහතික කොට ඉදිරිපත් කළ යුතුය. එය ඉංග්‍රීසි භාෂාවෙන් නොවන විට එහි ඉංග්‍රීසි පරිවර්තනය විදේශ තානාපති කාර්යාලයෙන් සහතික කළ යුතුය.

**3.6. විශේෂ කාර්යය වාහන ( ශීතාගාර, කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍ර, දොඹකර ආදිය).**

**3.6.1. විශේෂ කාර්යය වාහන සඳහා පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කළ ආයතන සඳහා ආනයන බලපත්‍ර ලබා දීම සලකා බලනු ලැබේ.**

ආනයනය කරනු ලබන වාහන වර්ගී කරණයට අනුව දක්වා ඇති වයස්කාණ්ඩ වලට අනුකූල විය යුතු අතර වාහනය නිෂ්පාදිත දින සිට වයස ගණනය කරනු ඇත.

වාහන ස්වභාවය මත රේගු සංකේත වර්ගීකරණයට (Harmonized Code) අනුව වයස -

8705.20.20, 8705.90.12, 8705.30.20, 8705.90.92 } අවුරුදු 07 සිට උපරිම සීමාව අවුරුදු 10දක්වා

8705.10.20, 8705.40.20, 8705.90.32. } අවුරුදු 10 සිට උපරිම සීමාවඅවුරුදු 15 දක්වා

I. ඉහත සඳහන් වාහන භාවිතයට ගනු ලබන ක්ෂේත්‍රයේ ව්‍යාපාරයක වසර 02කට වැඩි කාලයක් ක්‍රියාකාරීව නිරතවන බවට ග්‍රාම නිලධාරීගේ සහතිකය.
II. අඛණ්ඩ මාස 06 ක බැංකු ගිණුම් ප්‍රකාශ ඉදිරිපත් කළ යුතුය.
III. වාහනය ශ්‍රී ලංකාවේ පිළිගත් වායු විමෝචන ප්‍රමිතීන් හා ආරක්ෂක ප්‍රමිතීන් වලට අනුකූල විය යුතුය
IV. ඉදිකිරීම් සංවර්ධන ආයතනයේ (CIDA)ලියාපදිංචි වී වසර 01ක් ඉකුත්ව තිබිය යුතු අතර එය යාවත්කාලීන කළ වලංගු සහතිකයක් විය යුතුය.
V. වාහනය බලපත්‍රලාභියා නමින්ම ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ යුතු අතර, එදින සිට වසර 02 ( දෙකක් ) යනතුරු විකිණීම, පැවරීම, වෙනත් අයුරකින් අන්සතු කිරීම නොකල යුතුය.

**3.7. ගිනි නිවීමේ රථ.**

**3.7.1.නිෂ්පාදිත දිනයේ සිට වසර 07 ක් ඉක්මවූ හා වසර 10 ක් නොඉක්මවූ වාහන සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති ආයතන සඳහා ආනයන පාලන බලපත්‍ර නිකුත් කිරීම සඳහා සලකා බලනු ලැබේ.**

I. ගිනි නිවීම් උපකරණ යෙදවීමේ කාර්ය භාරය සහිතරාජ්‍ය ආයතන සඳහා පළාත් පාලන අමාත්‍යාංශයේ හෝ අදාල අමාත්‍යාංශයේ ලේකම්ගේ පුද්ගලික නිර්දේශය ඉදිරිපත් කල යුතුය.
II. ගිනි සම්බන්ධව දැඩි අවධානමක් ඇති පෞද්ගලික ආයතන සම්බන්ධයෙන්ද ආනයන බලපත්‍ර නිකුත් කිරීම සලකා බැලිය හැකිය.
III. එහිදී ආනයන අපනයන පාලන ජනරාල් විසින් පත්කළ කමිටුවක් මගින් එහි යෝග්‍යතාව සලකා බලා ලබාදෙන නිර්දේශ අනුව ආනයන අපනයන පාලක ජනරාල් විසින් ආනයන බලපත්‍ර ලබාදීම පිළිබඳ තීරණය ගනු ඇත.
එහිදී -
   i. ගිනි නිවන රථයක් ආනයනය කිරීමට හා පවත්වා ගෙන යාමට ඇති මූල්‍යමය හැකියාව.
   ii. ව්‍යාපාරයේ ස්වභාවය.
   iii. යෙදවීමට අපේක්ෂිත ස්ථානයේ සේවක සංඛ්‍යාව, ගොඩනැගිලි හා අවට පරිසර ස්වභාවය පිළිබඳ සලකා බැලෙනු ඇත.
IV. අදාල ක්ෂේත්‍රයේ ව්‍යාපාරයක වසර 01 කට වැඩි කාලයක් ක්‍රියාකාරීව නිරතව සිටීම ( ඒ සඳහා තම ව්‍යාපාරය විසින් කරන ලද නිෂ්පාදන ආයෝජන ආදිය පිළිබඳ වාර්තා ඉදිරිපත් කල යුතුය)
V. වාහනය බලපත්‍රලාභියා නමින්ම ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ යුතු අතර, එදින සිට වසර 03(තුනක් ) යනතුරු විකිණීම, පැවරීම, වෙනත් අයුරකින් අන්සතු කිරීම නොකල යුතුය.

**<u>3.8.බර වාහන (ට්‍රක් රථ).</u>**

3.8. නිෂ්පාදිත දින සිට වසර 10 ක් ඉක්මවූ හා වසර 15 ක් නොඉක්මවූ වාහන (ට්‍රක් රථ )සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති ආයතන සඳහා ආනයන පාලන බලපත්‍ර නිකුත් කිරීම සඳහා සලකා බලනු ලැබේ.

I. ඉහත සඳහන් වාහන භාවිතයට ගනු ලබන ක්ෂේත්‍රයේ ව්‍යාපාරයක වසර 02ක් ඉක්මවන ලද ව්‍යාපාර නාම ලියාපදිංචි සහතිකය හෝ ඉදිකිරීම් සංවර්ධන අධිකාරියේ( CIDA) ලියාපදිංචි සහතිකයක් මඟින් සනාථ කළ යුතුය.
II. තම ව්‍යාපාරය ලබාගත් කොන්ත්‍රාත්, ව්‍යාපාර ස්වභාවය ආදිය පිළිබඳ වාර්තා ඉදිරිපත් කළ යුතුය.
III. වාහනය ශ්‍රී ලංකාවේ පිළිගත් වායු විමෝචන ප්‍රමිතීන් හා ආරක්ෂක ප්‍රමිතීන් වලට අනුකූල විය යුතුය.
IV. වසර 02 ක් ගතවන තුරු විකිණීම, පැවරීම හෝ අන්සතු කිරීම කළ නොහැකිය.

**3.8.2.එක් අයෙකුට වසරකට එක් වාහනයක් සඳහා බලපත්‍ර එකකට වඩා ලබාදීම සලකා බලනු නොලැබේ.**

**<u>3.9.විශේෂ කාර්ය වාහන (බව්සර්, ගලි බව්සර්, කුණු බැහැර කිරීමේ රථ ජංගම කාර්යය වාහන)</u>**

3.9.1. විශේෂ කාර්ය වාහන (බව්සර්, ගලි බව්සර්, කුණු බැහැර කිරීමේ රථ, ජංගම කාර්යය වාහන) සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අය වෙත ආනයන බලපත්‍ර නිකුත් කිරීම සලකා බලනු ලැබේ. ආනයනය කරනු ලබන වාහන වර්ගීකරණය අනුව දක්වා ඇති වයස්කාණ්ඩ වලට අනුකූල විය යුතු අතර නිෂ්පාදන දින සිට වයස ගණනය කරනු ඇත.

3.9.2. විශේෂ ජංගම කාර්යය වාහන සඳහා බලපත්‍ර ලබාදෙනුයේ රාජ්‍ය ආයතන සඳහා පමණි. ඒ සඳහා අදාල අමාත්‍යාංශයේ ලේකම්ගේ පුද්ගලික නිර්දේශය අවශ්‍ය වේ.

3.9.3. ගලි බව්සර් හා කුණු බැහැර කිරීමේ රථ සඳහා ඉල්ලුම් කිරීමට,

- පළාත් පාලන ආයතනයක් වීම.( ඒ සඳහා එකී වාහනය මිලදී ගැනීමට ගත් සභා තීරණය සමග අදාල අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය අවශ්‍ය වේ).
- අදාල වාහනයක්භාවිතා කොට සෘජු ව්‍යාපාරයක වසර 02කට වඩා කාලයක් නිරත වූ ව්‍යාපාරික ආයතනයක් වීම.

| | |
|---|---|
| 8704.31.12, 8704.32.43<br>8704.21.14, 8704.22.52,<br>8704.23.62, 8704.31.14<br>8704.32.52 | අවුරුදු 05 සිටඋපරිම සීමාව අවුරුදු 10දක්වා |
| 8704.22.43, 8704.23.53<br>8704.22.63, 8704.23.73, 8704.32.63 | අවුරුදු 10සිට උපරිම සීමාවඅවුරුදු 15 දක්වා |
| 8705.90.22 | අවුරුදු 07 සිටඋපරිම සීමාව අවුරුදු 10 දක්වා |

**පෞද්ගලික අංශ සඳහා.**

I. ඉහත සඳහන් වාහන භාවිතයට ගනු ලබන ක්ෂේත්‍රයේ ව්‍යාපාරයක වසර 02ක් ඉක්මවන ලද ව්‍යාපාර නාම ලියාපදිංචි සහතිකය හෝ ඉදිකිරීම් සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචි සහතිකයක් මඟින් සනාථ කළ යුතුය.

II. තම ව්‍යාපාරය ලබාගත් කොන්ත්‍රාත්, ව්‍යාපාර ස්වභාවය ආදිය පිළිබඳ වාර්තා ඉදිරිපත් කළ යුතුය.

III. වාහනය බලපත්‍රලාභියා නමින්ම ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ යුතු අතර, එදින සිට වසර 03(තුනක් ) යනතුරු විකිණීම, පැවරීම, වෙනත් අයුරකින් අන්සතු කිරීම නොකල යුතුය.

**04.** **උක්ත බලපත්‍ර යටතේ ලංකාවට ආනයනය කරන ලද වාහන රේගුවෙන් නිදහස් කර ගැනීමට පෙර මෙම දෙපාර්තමේන්තුව මඟින් හර කළ යුතුය.**

<u>ඒ සඳහා ඉදිරිපත් කළ යුතු ලේඛන</u>

I. රේගු සටහන (Custom Declaration ).

II. නැව්ගත කිරීමේ සහතිකය (Bill of lading).

III. වාණිජ ඉන්වොයිසිය (වාණිජ බැංකුව විසින් සහතික කළ යුතුය).

IV. දෙපාර්තමේන්තුව පිළිගත් ආයතනයකින් නිකුත් කරන ලද පූර්ව නැව්ගත කිරීමේ සහතිකය.

V. අපනයන සහතිකය, ලියාපදිංචි සහතිකය හෝ ලියාපදිංචිය අවලංගු කිරීමේ සහතිකය (ඉංග්‍රීසි භාෂාවෙන් නොවන විටකදී ලියාපදිංචි භාෂා පරිවර්තයෙකු සහතික කරන ලද පරිවර්තනය)

VI. මෙම දෙපාර්තමේන්තුව පිළිගත් ආයතනයකින් ලබාගත් වායු විමෝචන ප්‍රමිතීන් හා ආරක්ෂන ප්‍රමිතීන් පිළිබඳ සහතිකය.

VII. වාහනය මඩ සහ පස් වලින් තොරවන බව සහතිකය.

VIII. වාහනයේ වායුසමීකරන පද්ධතිය ක්ලෝරෝ ෆ්ලෝරෝ කාබන් වලින් නිදහස් බවට සහතිකය (CFC free Certificate)

IX. තක්සේරු වාර්තාව

X. ආනයන පාලන බලපත්‍රය.

වැදගත්

- උක්ත සඳහන් සියලු කරුණු හුදෙක් මහජනතාවගේ පහසුව සඳහා දක්වා ඇති මාර්ගෝපදේශ වේ.
- ඉහත සඳහන් ලේඛනවලට අමතරව වෙනත් ලේඛන ඉල්ලා සිටින විටෙක ඒවා ලබාදීමට ආනයනකරු බැඳී සිටී.
- ව්‍යාජ ලේඛන ඉදිරිපත් කොට ඇතිබව අනාවරණය වූ විටෙක ආනයන පාලන බලපත්‍රය අවලංගු කිරීම, ප්‍රතිඅපනයනය සඳහා නියෝග කිරීම, ආයතනය හෝ පුද්ගලයා අසාධුලේඛනගත කිරීම, හෝ වෙනත් නීතිමය ක්‍රියාමාර්ගයක් ගැනීම පිළිබඳ ආනයන හා අපනයන පාලක ජනරාල්වරයා විසින් පියවර ගනු ඇත .

කෙසේ වෙතත් බලපත්‍රයක් නිකුත් කිරීම, සංශෝධනය කිරීම, අත්හිටුවීම ,අවලංගු කිරීම හෝ උක්ත සඳහන් කරුණු සම්බන්ධයෙන් පැනනගින කවර හෝ කරුණක් සම්බන්ධයෙන් අවසාන තීරණය ගැනීම ආනයන හා අපනයන පාලන පනතෙන් පැවරෙන බලතල ප්‍රකාරව ආනයන හා අපනයන පාලක ජනරාල්වරයා සතුවේ.

ටී.වී.ඩී.දමයන්ති එස් කරුණාරත්න
ආනයන අපනයන පාලක ජනරාල්
**2019.05.15**